# රාමායණ මිථ්‍යා සංචාරය (“Ramayana trail”)

ශ්‍රී ලංකාව බුදුදහමින් පෝෂණය වූ සාරවත් සංස්කෘතියකින් යුක්ත රටකි. මේ ශිෂ්ටාචාරයට අයත් බොහෝ පුරාවිද්‍යාත්මක නෂ්ටාවශේෂ මෙන්ම අද ද වන්දනාවට පාත්‍ර වූ සිද්ධස්ථාන මෙ රට පුරා පවතී. මේවා ලෝකයේ විවිධ රටවලින් පැමිණෙන සංචාරකයින්ගේ ආකර්ෂණයට පාත්‍රව ඇති ප්‍රධාන ස්ථාන වේ.

එ තරම් පොහොසත් සංස්කෘතික සම්පත් තිබිය දී මෙ රට සංචාරක බලධාරීහු මේ වන විට “ රාමායණ සංචාරය” නමින් රාමායණයේ සඳහන් යයි කියන ව්‍යාජ ස්ථාන නිර්මාණය කරමින් ඉතිහාසය විකෘති කරති. මෙහි ඉලක්කය වන්නේ හින්දු මූලධර්මවාදීන් සුළු සංචාරක පිරිසක් මෙ රටට ගෙන්වා ගැනීම ය. රාමායාණයට ඓතිහාසික පදනමක් නොමැති බව ඉන්දීය ශාස්ත්‍රඥයන් තහවුරු කර ඇත. ඉන්දියාවේ රාමායණ සංචාරයක් නැත. එහෙත් බෞද්ධ සිද්ධස්ථාන සංචාරය (“Buddhist Circuit”) ඉන්දියානු සංචාරක ව්‍යාපාරයේ ප්‍රධාන අංගයකි.

වසර 166 කට වඩා පැරණි ශ්‍රී ලංකා රාජකීය ආසියාතික සමිතියේ අභ්‍යන්තර ශාස්ත්‍රීය සම්මන්ත්‍රණ වලදී පැහැදිළි වූයේ යටකී ස්ථානවලට රාමායණ කථාවේ කිසිදු ඓතිහාසික සම්බන්ධයක් නොමැති බව ය. මෙම සම්මන්ත්‍රණවලට සහභාගි වීම සඳහා සංචාරක අධිකාරයේ "විද්වතුන්ට" ආරාධනා කරනු ලැබුව ද ඔවුන් පැමිණියේ නැත. මේ මතවාදය ප්‍රවර්ධනය කිරීම මගින් හානිදායක ප්‍රතිඵල ඇති විය හැකිය. නිදසුනක් ලෙස තවත් ව්‍යාජ නිජබිමක් නිර්මාණය කිරීමෙන් අනාගතයේ දී දෙවැනි යුද්ධයක් උද්ගත විය හැකිය. මේ නිසා උක්ත කරුණ පිළිබඳව දැනුවත් කිරීම සඳහා මෙම විෂය පිළිබඳ විශේෂඥයන්ගේ ප්‍රසිද්ධ සම්මන්ත්‍රණයක් සංවිධානය කර ඇත.

2010 ජුලි 17 දින කොළඹ 7 මහවැලි කේන්ද්‍ර ශ්‍රවනාගාරයේ දී උදේ 8.30 සිට 12.30 දක්වා පැවැත්වෙන මේ සම්මන්ත්‍රණයේ වැඩසටහන පහත දැක්වේ.

1. හැඳින්වීම

2. සංචාරක මණ්ඩලයේ "රාමායණ සංචාරය" පිළිබඳ විස්තරය - ගැස්ටන් පෙරේරා මහතා

3. "රාමායණ සංචාරය" ප්‍රතික්ෂේප කිරීම නිසා මා මුහුණ දුන් ප්‍රශ්න - හැගොඩ විපස්සි හිමි

4. සිංහල සාහිත්‍යයෙහි සඳහන් රාමායණ කථාව - මහාචාර්ය තිස්ස කාරියවසම්

5. ලංකාවේ ප්‍රාග් ඉතිහාසයේ සත්‍ය කරුණු - ආචාර්ය නිමල් පෙරේරා

6. පුරාවිද්‍යා සාක්ෂි විකෘති කිරීම - ආචාර්ය මාලිනි ඩයස්

7. ස්වාභාවික විද්‍යා සාධක විකෘති කිරීම - ධනේෂ් විසුම්පෙරුම මහතා

8. තායිලන්තය ඇතුළු අග්නිදිග ආසියාවේ බෞද්ධ සිද්ධස්ථාන වෙනුවට මිථ්‍යා රාමායණයක් ඉස්මතු කිරීම - ආචාර්ය හේමා ගුණතිලක

9. ඉන්දියාවේ බෞද්ධ සිද්ධස්ථාන සංචාරයක් (“Buddhist Circuit”) මිස රාමායණ සිද්ධස්ථාන සංචාරයක් නැත - මහාචාර්ය ඔලිවර් අබේනායක

10. "රාමායණ සංචාරයෙන්" මතුවන විදේශ ප්‍රතිපත්තිමය ප්‍රශ්න - තානාපති බන්දු ද සිල්වා මහතා